(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 85.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2025 සැප්තැම්බර් 25 බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **(වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා,** කථානායකතුමා

ගරු **(වෛද්‍ය) රිස්වි සාලි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **හේමාලි වීරසේකර මහත්මිය,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය

---

ගරු **ආචාර්ය හරිනි අමරසූරිය,** අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය

ගරු **(මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා,** රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා,** විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා

ගරු **අනුර කරුණාතිලක මහතා,** නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා

ගරු **සුනිල් කුමාර ගමගේ මහතා,** තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා

ගරු **කුමාර ජයකොඩි මහතා,** බලශක්ති අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,** සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **(ආචාර්ය) අනිල් ජයන්ත මහතා,** කම්කරු අමාත්‍යතුමා සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) දම්මික පටබැඳි මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා,** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා

ගරු **බිමල් රත්නායක මහතා,** ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **ආනන්ද විජේපාල මහතා,** මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා

ගරු **කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා,** වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **සුනිල් හඳුන්නෙත්ති මහතා,** කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **නාමල් කරුණාරත්න මහතා,** කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජනිත රුවන් කොඩිතුවක්කු මහතා,** වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රත්න ගමගේ මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එරංග ගුණසේකර මහතා,** තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා,** ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඇන්ටන් ජයකොඩි මහතා,** පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මහින්ද ජයසිංහ මහතා,** කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා,** ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත පියතිස්ස මහතා,** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා,** ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ සුනිල් වටගල මහතා,** මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එරංග වීරරත්න මහතා,** ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. සරත් මහතා,** නිවාස නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා,** අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන් හේමචන්ද්‍ර මහතා,** විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **රොෂාන් අක්මීමන මහතා**

ගරු **අම්ර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**

ගරු **අබූබකර් අතම්බාවා මහතා**

ගරු **නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය**

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා**

ගරු **නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා**

ගරු **(මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා**

ගරු **(වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා**

ගරු **(වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**

ගරු **ජේ.සී. අලවතුවල මහතා**

ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා

ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය

ගරු බී. ආරියවංශ මහතා

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා

ගරු කේ. ඉලංකුමාරන් මහතා

ගරු අර්කම් ඉල්යාස් මහතා

ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු ක්‍රිෂ්නන් කලෛයිචෙල්වි මෙනෙවිය

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා

ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය

ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා

ගරු චමින්ද ලලිත් කුමාර මහතා

ගරු නීතිඥ සරත් කුමාර මහතා

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය

ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය

ගරු තිලංක යූ. ගමගේ මහතා

ගරු නීතිඥ නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය

ගරු චතුර ගලප්පත්ති මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු අජිත් ගිහාන් මහතා

ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මහතා

ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය

ගරු අශෝක ගුණසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු ගයාන් ජනක මහතා

ගරු රුවන්තිලක ජයකොඩි මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු දිලිත් ජයවීර මහතා

ගරු නිශාන්ත ජයවීර මහතා

ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය

ගරු ටී.කේ. ජයසුන්දර මහතා

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා

ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා

ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා

ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය

ගරු චන්දන තෙන්නකෝන් මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු තනුර දිසානායක මහතා

ගරු ධර්මප්‍රිය දිසානායක මහතා

ගරු සුජීව දිසානායක මහතා

ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා

ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා

ගරු නන්දන පත්මකුමාර මහතා

ගරු අරුණ පනාගොඩ මහතා

ගරු නිමල් පලිහේන මහතා

ගරු නිශාන්ත පෙරේරා මහතා

ගරු අජිත් පී. පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා

ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා

ගරු කන්දසාමි ප්‍රභු මහතා

ගරු අමිල ප්‍රසාද් මහතා

ගරු ලාල් ප්‍රේමනාත් මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු නන්ද බණ්ඩාර මහතා

ගරු පද්මසිරි බණ්ඩාර මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා

ගරු සුදත් බලගල්ල මහතා

ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා

ගරු ඊ.එම්. බස්නායක මහතා

ගරු විජේසිරි බස්නායක මහතා

ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා

ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා

ගරු ජගත් මනුවර්ණ මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු චානක මාදුගොඩ මහතා

ගරු රුවන් මාපලගම මහතා

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා

ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා

ගරු සංජීව රණසිංහ මහතා

ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා

ගරු සුනිල් රත්නසිරි මහතා

ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා

ගරු මංජුල සුගත් රත්නායක මහතා

ගරු සුරංග රත්නායක මහතා

ගරු ඒ.එම්.එම්.එම්. රත්වත්තේ මහත්මිය

ගරු තුරෛරාසා රවිකරන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා

ගරු මනෝජ් රාජපක්ෂ මහතා

ගරු සුනිල් රාජපක්ෂ මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු වරුණ ලියනගේ මහතා

ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය

ගරු දීප්ති වාසලගේ මහත්මිය

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා

ගරු කංචන වැලිපිටිය මහතා

ගරු ආර්.ජී. විජේරත්න මහතා

ගරු රුවන් විජේවීර මහතා

ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා

ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා

ගරු ජගත් විතාන මහතා

ගරු අතුල වෙළඳගොඩ මහතා

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

ගරු ඵස්මින් ෂරීෆ් මහතා

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යාලිංගම් මහතා

ගරු තිළිණ සමරකෝන් මහතා

ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා

ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය

ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා

ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා

ගරු දේවානන්ද සුරවීර මහතා

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා

ගරු කිට්නන් සෙල්වරාජ් මහතා

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා

ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා

ගරු කබීර් හෂීම් මහතා

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා

ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා

ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා

ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා

ගරු දිනේෂ් හේමන්ත මහතා

ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය

ගරු නීතිඥ භාග්‍යා ශ්‍රී හේරත් මහතා

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**

**ගරු රියාස් ෆාරුක් මහතා**

කුෂානි රෝහණදීර මහත්මිය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

චමින්ද කුලරත්න මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස් විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. ජනාධිපතිවරයාගෙන් ලද සංදේශ:** ජනාධිපතිවරයාගෙන් ලද මතු පළවන සංදේශය කථානායකවරයා විසින් කියවන ලදී:—

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/7/IX/3/01

2025 සැප්තැම්බර් මස 22 වන දින

**ගරු අයි.ඩබ්ලිව්.එම්. ජගත් වික්‍රමරත්න මැතිතුමා**
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි,

**(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත**

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව, මහජන සාමය පවත්වාගෙන යාම සඳහා වන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, පළමුවැනි උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන සන්නද්ධ හමුදාවල සියළුම සාමාජිකයින් එහි දෙවැනි උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන ප්‍රදේශවල මහජන සාමය පවත්වාගෙන යාම සඳහා කැඳවන බවට ආඥාවක් නිකුත් කොට ඇත.

ඒ අනුව, උක්ත ආඥා පනතේ 21(2) වගන්තිය සමග කියවිය යුතු 2(3) වගන්තිය ප්‍රකාරව ඒ බව පාර්ලිමේන්තුව වෙත මෙයින් දැනුම් දෙමි.

මෙයට - හිතවත්

අනුර කුමාර දිසානායක
ජනාධිපති

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு
Democratic Socialist Republic of Sri Lanka

**2. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු සඳහන් නිවේදනය කරන ලදී:—

"ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා ඇතුළු විරුද්ධ පාර්ශ්වයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 32 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් විසින් ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍ය ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතාට එරෙහිව 2025.08.12 දින ඉදිරිපත් කරන ලද 'විශ්වාසභංග යෝජනාව' යනුවෙන් නම් කරන ලද යෝජනාව සම්බන්ධයෙන් 2025.09.08 දින මා විසින් කරන ලද නිවේදනයට වැඩිමනත් වශයෙන් මෙම නිවේදනය සිදු කිරීමට කැමැත්තෙමි.

පාර්ලිමේන්තුවේ කථානායකවරයා පාර්ලිමේන්තුවේ නීති රීති පිළිපැදීම සඳහා වගකිව යුතු බවත්, ඕනෑම නියෝගයක් සම්බන්ධයෙන් ඔහුගේ/ඇයගේ තීරණය අභියාචනයට විවෘත නොවන බවත්, දැනුම් දීමෙන් පසු ඉදිරිපත් කරන ලද පූර්ණ යෝජනාවක් මත හැර පාර්ලිමේන්තුව විසින් සමාලෝචනය නොකළ යුතු බවත් සඳහන් ස්ථාවර නියෝග 76(1) මෙම සභාවට ආරම්භයේදීම මතක් කර දීමට මම කැමැත්තෙමි.

කෙසේ වෙතත්, පාර්ලිමේන්තුවේදී මතු කරන ලද විමසීම් සලකා බලන විට, එම යෝජනාව බැහැර කිරීම සම්බන්ධයෙන් පසුගිය නිවේදනයේ අවධාරණය කර ඇති සාධක තවදුරටත් සනාථ කිරීමට කැමැත්තෙමි.

1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග, අමාත්‍ය මණ්ඩලයේ තනි අමාත්‍යවරයෙකුට, නියෝජ්‍ය අමාත්‍යවරයෙකුට හෝ වෙනත් අමාත්‍ය ධුර දරන්නෙකුට එරෙහිව විශ්වාසභංග යෝජනාවක් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අදහසක් ප්‍රකාශ කර නොමැත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 49(2) ව්‍යවස්ථාව රජයකට එරෙහිව විශ්වාසභංග යෝජනාවක් ඉදිරිපත් කිරීමට විධිවිධාන සලසන විශ්වාසභංග යෝජනා සම්බන්ධයෙන් පවතින එකම විධිවිධානය වේ.

කෙසේ වෙතත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ ස්ථාවර නියෝගවල එම නිහඬතාවය නොතකා, අග්‍රාමාත්‍යවරයාට, අමාත්‍ය මණ්ඩලයේ තනි අමාත්‍යවරුන්ට එරෙහිව විශ්වාසභංග යෝජනා ඉදිරිපත් කර ඇති අතර, එවැනි පූර්වාදර්ශයේ නෛතික පදනම ප්‍රශ්න කිරීමකට ලක් වී තිබේ.

පාර්ලිමේන්තු සන්දර්භය තුළ, කථානායක, නියෝජ්‍ය කථානායක, නියෝජ්‍ය කාරක සභා සභාපති, පාර්ලිමේන්තුවේ සභානායක, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායක සහ විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායක යන අය පාර්ලිමේන්තු නිල දරන්නන් ලෙස සලකනු ලබන අතර, මෙවැනි පූර්ණ යෝජනාවක් ඔවුන්ට එරෙහිව සුදුසු ලෙස ගෙන ඒමට හැකි බව සටහන් වේ.

ජාත්‍යන්තර සන්දර්භය තුළ, විශ්වාසභංග යෝජනා සඳහා අවසර දී ඇත්තේ රජය/සමස්තයක් ලෙස අමාත්‍ය මණ්ඩලය සම්බන්ධයෙන් පමණක් බව මම අවධාරණය කිරීමට කැමැත්තෙමි (Erskine May, 'Treatise on the Law, Privileges, Proceedings and Usage of Parliament', 25th Ed. and M.N. Kaul and S.L. Shakdher, 'Practice and Procedure of Parliament', 8th Ed.). තවද, ලෝක් සභාව කෙරෙහි අමාත්‍ය මණ්ඩලයේ සාමූහික වගකීම සම්බන්ධයෙන් ඉන්දියානු ව්‍යවස්ථාපිත විධිවිධානවලට අනුව, විශ්වාසභංග යෝජනාවක් ඉදිරිපත් කළ හැක්කේ සමස්තයක් ලෙස අමාත්‍ය මණ්ඩලයට එරෙහිව පමණක් බවත්, කිසිදු තනි අමාත්‍යවරයෙකුට එරෙහිව නොවන බවත් එම්.එන්. කෞල් සහ එස්.එල්. ෂක්දර් අවධාරණය කර තිබේ.

එසේම, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 42, 43 සහ 44 ව්‍යවස්ථා මඟින් අමාත්‍ය මණ්ඩලයේ සාමූහික සහ තනි අමාත්‍ය වගකීම සඳහා විධිවිධාන සලසා ඇත.

වර්තමානයේ ශ්‍රී ලංකාවේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46(1) වගන්තිය යටතේ නියෝජ්‍ය අමාත්‍යවරුන් පත් කර ඇත්තේ අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරුන්ට සහාය වීම සඳහා ය. කෙසේ වෙතත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46(2) වගන්තිය යටතේ ක්‍රියා කරන වත්මන් රජයේ කැබිනට් මණ්ඩලයේ අමාත්‍යවරුන්, කිසිදු විෂයයකට හෝ කාර්යයකට අදාළ කිසිදු බලයක් හෝ රාජකාරියක් නියෝජ්‍ය අමාත්‍යවරුන්ට පවරා නොමැත. කෙසේ වෙතත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 74 වන ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46 (1) ව්‍යවස්ථාවට අනුකූලව, නියෝජ්‍ය අමාත්‍යවරුන්, අමාත්‍යවරුන් වෙනුවෙන් ස්ථාවර නියෝග 32(2) ප්‍රකාරව, කටයුතු කරන බව සඳහන් කිරීමට කැමැත්තෙමි.

ඉහත සඳහන් හේතු නිසා, ස්ථාවර නියෝග 27(3) ප්‍රකාරව මෙම යෝජනාව රීති විරෝධී යැයි මම තීරණය කරමි.

විකල්පයක් ලෙස, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ හැසිරීම් පිළිබඳ හෝ විශේෂයෙන්ම කථානායකවරයා ඇතුළු මහජන මන්ත්‍රී මණ්ඩලයේ තනතුරු දරන සාමාජිකයින් වෙත කෙරෙන ආනුෂංගික විවේචන සඳහා අවසර දෙනු ලබන්නේ පූර්ණ යෝජනාවක් (Erskine May, 'Treatise on the Law, Privileges, Proceedings and Usage of Parliament', 25th Ed.), හරහා පමණක් බව පෙන්වා දීමට කැමති අතර, එක්සත් රාජධානියේ භාවිතය අනුව රජයේ ප්‍රතිපත්තියක් හෝ අමාත්‍යවරයෙකු විවේචනය කරමින් අප්‍රසාදය පළ කිරීමේ යෝජනාවක් ඉදිරිපත් කළ හැකි ය. එම්.එන්. කෞල් සහ එස්.එල්. ෂක්දර් ('Practice and Procedure of Parliament', 8th Ed.) පවසන ආකාරයට අමාත්‍ය මණ්ඩලයට හෝ තනි අමාත්‍යවරයෙකුට හෝ අමාත්‍ය කණ්ඩායමකට එරෙහිව ක්‍රියා කිරීමට අපොහොසත් වීම හෝ ක්‍රියා නොකිරීම හෝ ඔවුන්ගේ ප්‍රතිපත්තිය සඳහා අප්‍රසාදය පළ කිරීමේ යෝජනාවක් ඉදිරිපත් කිරීමත්, අමාත්‍යවරයාගේ හෝ අමාත්‍යවරුන්ගේ අසාර්ථකත්වය පිළිබඳව සභාවේ කණගාටුව, කෝපය හෝ පුදුමය ප්‍රකාශ කිරීමත් සිදු කළ හැකි ය.

ඒ අනුව, පාස්කු ඉරිදා ප්‍රහාරයට අදාළ කරුණුවල ජාතික වැදගත්කම සැලකිල්ලට ගනිමින් සහ නීතිපතිවරයාගේ මතය අනුව, මෙම යෝජනාවේ සඳහන් නිශ්චිත කරුණු අධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතින නඩුවලට සෘජු බලපෑමක් නොමැති බැවින්, දැනට නිකුත් කර ඇති යෝජනාව වෙනුවට පූර්ණ යෝජනාවක් ඉදිරිපත් කිරීමේ හැකියාව ගවේෂණය කරන ලෙස මම මෙම සභාවට දැනුම් දීමට කැමැත්තෙමි."

**3. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් 2023 වර්ෂය සඳහා වවුනියා විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් 2025 අංක 3 දරන විසර්ජන පනතේ 6(1) වගන්තිය ප්‍රකාරව 2025.08.01 සිට 2025.08.31 දක්වා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වැය ශීර්ෂ අංක 240 යටතේ සංවර්ධන කටයුතු වැඩසටහනෙන් වෙන්කර ඇති ප්‍රතිපාදන මඟින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන ඉදිරිපත් කරන ලදී.

එම ලිපිලේඛනය, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(3) ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් 2025 අංක 03 දරන පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කර, එම පරිපූරක ඇස්තමේන්තුව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**4. කාරක සභා වාර්තා පිළිගැන්වීම:** රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති, ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ රෙගුලාසි සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**5. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) පේරාදෙණිය, දොඩම්වලපිටිය, අංක 72/ඊ දරන ස්ථානයෙහි පදිංචි ටී.බී.ඒ.සී. කුලතුංග මහතාගෙන් ලැබුණු 2025.03.10 දිනැති පෙත්සම ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය විසින් පිළිගන්වන ලදී.

(2) නල්ලදරන්කට්ටුව, හැලඹවටවන, අංක 131/1 දරන ස්ථානයෙහි පදිංචි එස්.ඒ.එම්. රංජිත් සූරියහෙට්ටි මහතාගෙන් ලැබුණු 2025.04.05 දිනැති පෙත්සම ගරු අජිත් ගිහාන් මහතා විසින් පිළිගන්වන ලදී.

(3) (i) ගම්පහ, මුදුන්ගොඩ, මැදවත්ත, අංක 1/30 දරන ස්ථානයෙහි පදිංචි ඒ. ඒ. රංජනී මෙන්ඩිස් මහත්මියගෙන් ලැබුණු 2025.05.29 දිනැති පෙත්සම;

(ii) රත්නපුර, කොළඹ පාර, අංක 269/1 සී දරන ස්ථානයෙහි පදිංචි බී. ඥානවතී මහත්මියගෙන් ලැබුණු 2025.05.30 දිනැති පෙත්සම;

(iii) බෙලිහුල්ඔය, පඹහින්න, සමනළ මාවත යන ලිපිනයෙහි පදිංචි බී. ආර්. පොඩිමැනිකේ මහත්මියගෙන් ලැබුණු 2025.05.30 දිනැති පෙත්සම;

(iv) මීරිගම, නාවාන, කෙසෙල්කොටුව වත්ත, අංක 38/2 දරන ස්ථානයෙහි පදිංචි අයි. කේ. මාලනී විජේරත්න මහත්මියගෙන් ලැබුණු 2025.06.02 දිනැති පෙත්සම;

(v) ලෝලුවාගොඩ, අමරගිරි වත්ත, අංක 1/167 දරන ස්ථානයෙහි පදිංචි පී. ඒ. වී. ඩබ්. දයානි කුමාරි මහත්මියගෙන් ලැබුණු 2025.06.02 දිනැති පෙත්සම; සහ

(vi) වේයන්ගොඩ, මාළිගාතැන්න, අංක 96/2/2 දරන ස්ථානයෙහි පදිංචි එස්. ආර්. එම්. ඒ. ලීලාවතී සමරදිවාකර මහත්මියගෙන් ලැබුණු 2025.05.28 දිනැති පෙත්සම

ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා විසින් පිළිගන්වන ලදී.

(4) පිටබැද්දර, බුළුවන, සමර නිවස යන ලිපිනයෙහි පදිංචි එච්.ජී. ආරියවංශ මහතාගෙන් ලැබුණු 2025.06.30 දිනැති පෙත්සම ගරු ලාල් ප්‍රේමනාත් මහතා විසින් පිළිගන්වන ලදී.

(5) (i) මණ්ඩාවල, මාහේන, අංක 130/2බී දරන ස්ථානයෙහි පදිංචි අයි.පී. සෝමතිලක මහතාගෙන් ලැබුණු 2025.04.23 දිනැති පෙත්සම; සහ

(ii) ගණේමුල්ල, කැන්දලියද්ද පාළුව, අංක 177/3 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්.ඩී. මහේන්ද්‍ර උදය කුමාර මහතාගෙන් ලැබුණු 2025.03.25 දිනැති පෙත්සම

ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා විසින් පිළිගන්වන ලදී.

(6) (i) කුරුවිට, උඩකඩ වත්ත, අංක 676/ඊ දරන ස්ථානයෙහි පදිංචි එස්. නලීන් ප්‍රදීප් කුමාර මහතාගෙන් ලැබුණු 2025.06.09 දිනැති පෙත්සම; සහ

(ii) කුරුවිට, වතු යාය, ශ්‍රී සුමන විද්‍යාල පාර යන ලිපිනයෙහි පදිංචි ටී.බී.ජී. ප්‍රියන්ත මහතාගෙන් ලැබුණු 2025.06.09 දිනැති පෙත්සම

ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**6. ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි:** අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය වෙනුවෙන් කම්කරු අමාත්‍යතුමා සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 අගෝස්තු 15 දිනැති අංක 2449/60 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.09.12 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(පූ.භා. 11.34 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

(අ.භා. 1.00 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

(අ.භා. 2.18 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරිය මූලාසනාරූඪ විය.)

"ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 4.11 ට ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. කල් තැබීම (යෝජිත විදුලි ගාස්තු අඩු කිරීම):** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය" යි ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

එකල්හි වේලාව අ. භා. 5.30 පසු කර තිබුයෙන්, අද දින සභා සම්මතිය අනුව, අ. භා. 5.39 ට මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් පාර්ලිමේන්තුව කල් තබන ලදී.

ඊට අනුකූලව, පාර්ලිමේන්තුව 2025 සැප්තැම්බර් 26 සිකුරාදා පූ. භා. 9.30 වනතෙක් කල් ගියේ ය.